# විශ්වවිද්‍යාල සිසුන් දේශනවලට සහභාගි වීම ඔවුන්ගේ ප්‍රතිඵල සාධනය කෙරෙහි සිදු කරන බලපෑම

**සී. ටී. සමරසිංහ**[1]


## සංක්ෂේපය

විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රතිඵල විවිධ මට්ටම්වල පවතී. ප්‍රතිඵල අඩු, වැඩි වීමට විවිධ හේතු බලපානු ලබයි. විශ්වවිද්‍යාල සිසුන් දේශන වලට සහභාගි වීම කොතෙකුත් දුරට ඔවුන්ගේ ප්‍රතිඵල සාධනය කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම පිළිබඳ සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ස්තෘත සසම්භාවි නියැදුම් ක්‍රමය භාවිතා කරමින් පීඨ 04 න් එක් පීඨයකින් 20 දෙනා බැගින් 80 ක නියැදියක් තෝරා ගත් අතර සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදි. රැස් කරගත් දත්තයන් ප්‍රස්තාර සහ වගු ආදී විස්තරාත්මක සංඛ්‍යානමය ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. විශ්ලේෂණයට අනුව, 78.75% දේශන වලට සහභාගි වීම ප්‍රතිඵල සාධනයට බලපාන බව ප්‍රකාශ කරන අතර 21.25% ප්‍රතිශතයක් දේශන වලට සහභාගි වීම තම ප්‍රතිඵල සඳහා බල නොපාන බව සඳහන් කරයි. ඉහළ ප්‍රතිඵල ලබා ගැනීමට දේශන වලට සහභාගි වීම අවශ්‍ය බව ස්ත්‍රීන්ට අනුව 68.25% ක් ද පුරුෂයන්ට අනුව 31.74% ක් බව අනාවරණය විය. මෙම තත්ත්වය පීඨ අනුව සැලකීමේ දී මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවලට අනුව පිළිවෙළින් 14.28% ක් සහ 20.63% ක් ද වාණිජ හා කළමනාකරණ සහ විද්‍යා පීඨවලට අනුව පිළිවෙළින් 26.98% ක් සහ 38.09% ක් විය. එමෙන්ම දේශන වලට සහභාගි වීම සහ සිසුන්ගේ ප්‍රතිඵල වර්ධනය අතර ධන සහසම්බන්ධතාවයක් පවතින බව තහවුරු විය. ඒ අනුව, විශ්වවිද්‍යාල සිසුන්ගේ ප්‍රතිඵල සාධනය සඳහා දේශනවලට සහභාගි වීම ඍජුවම බලපාන බව ප්‍රත්‍යක්ෂ විය. ඊට අමතරව මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨ වල සිසුන් වාණිජ හා කළමනාකරණ සහ විද්‍යා පීඨ වල සිසුන්ට සාපේක්ෂව දේශන වලට සහභාගි වීම පහළ අගයක් වාර්තා කරන අතර වාණිජ සහ විද්‍යා පීඨවල සිසුන් දේශන වලට සහභාගී වීම ඉහළ අගයක පවතින බව නිගමනය කළ හැකිය. තමන්ගේ විභාග ප්‍රතිඵල වර්ධනය කර ගැනීමට විශ්වවිද්‍යාල සිසුන් නොකඩවා දේශන වලට සහභාගි වීම අවශ්‍ය බව මෙහිදී දැක්විය හැකිය.


**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, ප්‍රතිඵල, දේශන වලට සහභාගී වීම

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
chathurasamarasinghe.94@gmail.com